GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 011 2580886/ 0718552552 Fax : 011 2503586
Email : office@gmoa.lk Web : www.gmoa.lk

A CENTURY OF HEALING THE NATION
1926 - 2026
GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

2026.10.22

මාධ්‍ය නිවේදනය

පසුගිය පශ්චාත් සීමාවාසික ලැයිස්තුව සහ දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුවට අදාල අභියාචනාධිකරණ නඩුවේ වර්තමාන තත්ත්වය.

ශ්‍රේණි වෛද්‍යවරුන්ගේ ස්ථානමාරු ක්‍රමවේදයේදී අඛණ්ඩතාවය සහ ශක්තිමත් බව රැක ගැනීමෙහිලා මෙන්ම මෙරට පර්යන්ත සහ දුෂ්කර රෝහල් පද්ධතියේ සෞඛ්‍ය සේවාවන් ගුණාත්මකව සහ අඛණ්ඩව පවත්වා ගැනීමෙහිලා ද, දුෂ්කර සේවා ස්ථාන මාරු ලැයිස්තුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

පසුගිය පශ්චාත් සීමාවාසික ලැයිස්තුවේදි 2026.03.25 දින සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුව සකස් කිරීමේදි පෙර පැවති පිළිගත් ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කරමින් අත්තනෝමතික ලෙස කටයුතු කිරීම නිසා අර්බුදකාරී තත්ත්වයක් මතු විය.

එහිදි පැවති ක්‍රමවේදය නොසලකා හරිමින් නීත්‍යානුකූල පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයකින් ද තොරව එම ලැයිස්තුව සකස් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී.

මේ හේතුවෙන් 2025.07.03 දින සීමාවාසික පුහුණුව අවසන් කරන ලද වෛද්‍ය කණ්ඩායමට සිය පශ්චාත් සීමාවාසික පුරප්පාඩු ලැයිස්තුවේ ගැටලුකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදු වූ අතර එහිදි අගතියට සහ අසාධාරණයට ලක් වූ වෛද්‍යවරුන් දෙදෙනෙක් එම දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුව අභියෝගයට ලක් කරමින් ගරු අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී.

ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරු මණ්ඩලයේ නීත්‍යානුකූල පාර්ශවකරුවෙක් වන බැවින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ද එම නඩුවේ පාර්ශවකරුවෙක් ලෙස නම් කරන ලදී.

සියලු පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලූ ගරු අභියාචනාධිකරණය පසුගිය 2026.10.14 දින මෙම නඩුව ඉදිරියටත් විභාග කිරීමට තීරණය කරනු ලැබූ අතර පහත අතුරු තහනම් නියෝග දෙක ලබා දෙන ලදී.

1. මෙම අයදුම්පත පිළිබඳ අවසන් විභාගය සහ තීරණය ලබා දෙන තෙක්, ඉදිරිපත් කර ඇති 2025.07.04 දිනැති කණ්ඩායමට අයත් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගේ පශ්චාත් සීමාවාසික පුරප්පාඩු ලැයිස්තුවේ 'දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුව' (Difficult Station List) ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම.

2. වගඋත්තරකරුවන් අංක 4 සිට 7 දක්වා වන පාර්ශ්වයන්ගෙන් සමන්විත ස්ථාන මාරු මණ්ඩලය විසින් දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුවක් (Difficult Station List) නීත්‍යානුකූලව නිශ්චය කර අනුමත කර නොමැති තත්ත්වයක් තුළ, "2025.07.04 දිනැති කණ්ඩායමට අයත් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන පශ්චාත් සීමාවාසික පුරප්පාඩු ලැයිස්තුව (Vacancy List)" ක්‍රියාත්මක කිරීම මෙම අයදුම්පත පිළිබඳ අවසන් විභාගය සහ තීරණය ලබා දෙන තෙක් අත්හිටුවීම.

පැවති පිළිගත් ක්‍රමවේදය නොසලකා හරිමින් නිත්‍යානුකූල පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් තොරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගන්නා ලද අත්තනෝමතික තීරණ හේතුවෙන් මේ වන විට 2025.07.04 දිනැති කණ්ඩායමට අයත් ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් කණ්ඩායමේ පමණක් නොව සමස්ත වෛද්‍යවරුන්ගේ ස්ථානමාරු ක්‍රියාවලිය තුල ද අසාධාරණයට ලක් වී ඇත.

පසුගිය පශ්චාත් සීමාවාසික ලැයිස්තුවේ සහ දුෂ්කර සේවා ස්ථාන ලැයිස්තුවේ නිත්‍යානුකූල බව අධිකරණය ඉදිරියේ ප්‍රශ්නගත වී ඇති පසුබිමක පවතින අධිකරණ ක්‍රියාවලිය සමීපව නිරීක්ෂණය කරමින් එම ක්‍රියාවලිය තුල ගරු අභියාචනාධිකරණය විසින් ලබා දෙන නියෝග සහ උපදෙස් වලට යටත්ව මේ වන විට පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය නිවැරදි කිරීම සඳහාත්, අසාධාරණයට පත් වෛද්‍යවරුන්ට සාධාරණය ඉටු කිරීම සඳහාත් ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරු මණ්ඩලයේ නිත්‍යානුකූල පාර්ශවකරුවෙක් ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අවශ්‍ය සහයෝගය සහ මැදිහත් වීම සිදු කිරීමට කටයුතු කරනු ඇත.

ස්තූතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය යු. කේ. බී. වරකාගොඩ,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

වෛද්‍ය ලසිත ධම්මික (මාධ්‍ය ප්‍රකාශක)	-	0777611420
වෛද්‍ය ප්‍රභාත් සුගතදාස	-	0714471066
වෛද්‍ය පාලිත රාජපක්ෂ	-	0718480300
වෛද්‍ය චමිල් විජේසිංහ	-	0717080041
වෛද්‍ය හංසමාල් වීරසූරිය	-	0776549339
වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ	-	0716812160
වෛද්‍ය ආර්. තනිගවාසන්	-	0772369608
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ	-	0777829001
වෛද්‍ය අජන්ත රාජකරුණා	-	0766736296
වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ	-	0714410467
වෛද්‍ය අන්ෆාස් ෆාරූක්	-	0771115117
වෛද්‍ය සංජීව තල්ගහගොඩ	-	0716173330